**ජාතික මහා මාර්ග ආංශික ව්‍යාපෘතිය (අතිරේක මුල්‍යායනය ) - 2013**

**------------------------------------------------------------------------**

ජාතික මහා මාර්ග ආංශික ව්‍යාපෘතියේ (අතිරේක මුල්‍යායනය) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) හා ආසියානු සංවර්ධන බැංකුව (ආසංබැ) අතර 2011 දෙසැම්බර් 14 දින එළඹි අංක 2767 - එස්ආර්අයි දරන ව්‍යාපෘති ගිවිසුමේ ii ව්‍යවස්ථාවේ 2.09 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

**--------------------------------------------------------------------------------**

ව්‍යාපෘති ගිවිසුම අනුව, මහාමාර්ග, වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය (මවනාඅ) සහ මාර්ග සංවර්ධන අධිකාරිය (මාසංඅ) පිළිවෙලින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ජාතික මහාමාර්ග කිලෝමීටර් 62 ක පමණ පුනරුත්ථාපනය කිරීම් හා යළි සම්බන්ධ කිරීම් වැඩිදියුණු කිරීම මඟින් ජාතික ප්‍රවාහන කාර්යක්ෂමතාවය සංවර්ධනය කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 13,728 කට සමාන එජඩො මිලියන 105.60 ක් වන අතර ඉන් රු.මිලියන 11,050 කට සමාන එජඩො මිලියන 85 ක් මුල්‍යායනය කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව එකඟවී තිබුණි. 2013 දෙසැම්බර් 31 දිනට නිමවූ , ශ්‍රී ලංකා රජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2006 දෙසැම්බර් 14 දින එළඹි අංක 2767 එස්ආර්අයි දරන ව්‍යාපෘති ගිවිසුම යටතේ ක්‍රියාත්මක කරන ලද ජාතික මහාමාර්ග ආංශික ව්‍යාපෘතිය නම් වූ සමගාමී ව්‍යාපෘතිය සඳහා අතිරේක මුල්‍යායනයක් සැපයීමට මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ. මෙම ව්‍යාපෘති ද්විත්යම එකම ව්‍යාපෘති කළමනාකරණ ඒකකයක් ( ව්‍යාකඒ) විසින් පරිපාලනය කෙරෙන නමුත් අදාළ ව්‍යාපෘතීන් වෙනුවෙන් 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන වෙනම ඉදිරිපත් කර තිබුණි. මෙම ව්‍යාපෘතියේ කටයුතු 2015 දෙසැම්බර් 31 දින නිම කිරීමට අපේක්ෂිතය.

## 1.3 මුල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**--------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම , ක්‍රියාත්මක

කිරීම සහ පවත්වා ගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ යොදා ගැනීමත් අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2.** **විගණන විෂය පථය හා මතය සඳහා පදනම**

**----------------------------------------------**

මාගේ විගණන පරික්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරික්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරික්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදුකරන ලදි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරික්ෂා කිරීම් , මූල්‍ය ප්රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදි. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මඟින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ පද්ධති හා පාලන, ගනුදෙනු , වත්කම් , වගකීම් හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරික්ෂා කිරීම් ද එම පරික්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් හා වගකීම් , ණය යටතේ මිලදී ගැනීම් හඳුනා

ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඇ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඉ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඊ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මුලධර්ම පදනම් කර ගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(උ) අග්‍රිම අරමුදල් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ( ශ්‍රීලංමබැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඌ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම් සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකිද යන බව,

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(ඒ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**3. මතය**

--------

මාගේ පරික්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 5 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇති වන බලපෑම් හැර , මාගේ මතය වනුයේ

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඉ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

**4. මූල්‍ය ප්‍රකාශන**

-----------------

**4.1 මූල්‍ය කාර්ය සාධනය**

------------------------

මූල්‍ය ප්‍රකාශන හා ලබාගත හැකි වූ තොරතුරු අනුව , 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම රු.මිලියන 4,264 ක් වූ අතර, 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.මිලියන 6,043 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා වියදම හා ඉකුත් වර්ෂය සඳහා වියදම සහ 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| **විස්තරය** | **දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම** | | **2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම** |
|---|---|---|---|
| | **2013** | **2012** | |
| | **රු.** | රු. | රු. |
| ස්ථාවර වත්කම් - පිරිවැයට | 828,716 | - | 828,716 |
| කෙරීගෙන යන ඉදිකිරීම් වැඩ | 1,836,241,596 | 440,079,828 | 2,276,321,424 |
| උපදේශක සේවා පිරිවැය | 204,667,909 | 262,146,880 | 466,814,789 |
| ඉඩම් අත්පත් කර ගැනීම හා නැවත පදිංචි කිරීමේ පිරිවැය | 1,145,172,006 | 1,165,137,791 | 2,310,309,798 |
| ව්‍යාපෘති කළමනාකරණ ඒකක වියදම | 76,119,866 | 4,230,277 | 80,350,143 |
| ණය මත පොලී | 20,038,696 | 17,400,545 | 37,439,241 |
| ශුද්ධ ජංගම වත්කම් | 980,583,810 | (109,652,275) | 870,931,535 |
| එකතුව | 4,263,652,599 | 1,779,343,046 | 6,042,995,646 |

## 4.2 අග්‍රිම අරමුදල් ගිණුම

මූල්‍ය ප්‍රකාශන සහ ලබාගත හැකිවූ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය තුළ අග්‍රිම අරමුදල් ගිණුමේ මෙහෙයුම් හා 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය සාරාංශ කර පහත දැක්වේ.

| | එ.ජ.ඩො. | රු. | රු. |
|---|---|---|---|
| 2013 ජනවාරි 01 දිනට ශේෂය | 1,394,244 | | 177,293,152 |
| එකතුකළා - ඌන පූර්ණයන් | 1,550,681 | 203,485,350 | |
| විදේශ විනිමය වාසිය | | 1,189,928 | 204,675,278 |
| | 2,944,925 | | 381,968,430 |
| අඩු කලා : ආපසු ගැනීම් | 2,455,673 | | 317,997,319 |
| 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය | 489,252 | | 63,971,111 |

4.3 **ණය සම්මුතීන්**

-----------------

ණය ගිවිසුමේ 03 උපලේඛනයේ 06 (ආ) වගන්තිය අනුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ අග්‍රිම ගිණුමක් ස්ථාපිත කිරීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. තවද, ණය වියපැහැදම් කිරීමේ අත්පොතට හා ණය ගැණුම්කරු හා ආසියානු සංවර්ධන බැංකුව අතර එකඟ වූ විස්තරාත්මක වැඩපිළිවෙළට අනුකූලව අග්‍රිම ගිණුමට ලබා දෙන ලද සුදුසුකම්ලත් වියදම් ප්‍රතිපූරණය සඳහා වියදම් පරිපාටි ප්‍රකාශනය යොදා ගැනීමට ආසියානු සංවර්ධන බැංකුව එකග වී තිබුණි. ඉහත වැඩපිළිවෙළට අනුව, ප්‍රතිපූරණය කළ යුතු එක් තනි ගෙවීමක් එ.ජ.ඩො.100,000 ක් නොඉක්ම විය යුතුය. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 09 කදී අදාළ සීමාව ඉක්මවා තිබුණි.

5. **විගණන නිරීක්ෂණ**

---------------------

**5.1 ගිණුම්කරණ අඩුපාඩු**

**-----------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළ නිමකරන ලද රු.185,991,091 ක් වටිනා වැඩවලට අදාළ උපචිත වියදම් සඳහා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ආ) මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ඇතුළත් කිරීමට අවශ්‍ය සමහර තොරතුරු ඇතුළත් කර නොතිබුණි.

6. **මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

-------------------------------------

6.1 **අරමුදල් උපයෝජනය**

------------------------

ලබා ගත හැකිවූ තොරතුරු අනුව, ව්‍යාපෘති මූල්‍යයනය, අයවැයගත ප්‍රතිපාදන, සමාලෝචිත වර්ෂය තුළ අරමුදල් උපයෝජනය හා 2013 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කළ අරමුදල් පිළිබඳ වැදගත් සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| | ණය ගිවිසුමේ ප්‍රතිපාදනය කිරීම සඳහා එකඟ වූ මුදල | | 2013 වර්ෂයේ වාර්ෂික ඇස්තමේන්තුවල වෙන් කරන ලද මුදල | සමාලෝචිත වර්ෂය තුළ උපයෝජනය කළ මුදල | 2013 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කළ මුදල් | |
|---|---|---|---|---|---|---|
| | එ.ජ.ඩො. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | එ.ජ.ඩො. මිලියන | රු. මිලියන |
| ආ ස බැ | 85.00 | 11,050 | 2,526 | 2,526 | 28.32 | 3,723* |
| ශ්‍රී ලං ර | 20.60 | 2,678 | 1,139 | 1,139 | 17.85 | 2,321* |
| | 105.6 | 13,728 | 3,665 | 3,665 | 46.17 | 6,044 |

ආසියානු සංවර්ධන බැංකුවේ පෙර ණය අංක 2767 යටතේ ඉඩම් අත්පත් කර ගැනීම, මැනීම් කිරීම, උපයෝගී ද්‍රව්‍ය වෙනත් තැන්වලට මාරු කිරීම සඳහා දරන ලද පිරිවැය මෙම ව්‍යාපෘතියේ පිරිවැය යටතේද ඇතුළත් කර තිබුණි.

6.2 **කොන්ත්‍රාත් පරිපාලනය**

6.2.1 **මාර්ග වැඩි දියුණු කිරීම්**

ලැබී ඇති තොරතුරු අනුව, ව්‍යාපෘතිය විසින් වෙන්කරන ලද අරමුදල් යටතේ නිම කිරීම සඳහා අපේක්ෂිත මාර්ග වැඩි දියුණු කිරීම පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | මාර්ගය | දිග | වෙන්කරන ලද මුදල |
|---|---|---|---|
| | | කි.මී. | රු. මිලියන |
| ඒ 24 | මාතර - ගොඩගම | 3.40 | 671 |
| බී153 | හික්කඩුව- දකුණු මහාමාර්ග | 14.34 | 1,378 |
| බී157 | අළුත්ගම- දකුණු මහාමාර්ග | 11.07 | 1,892 |
| බී207 | කටුකුරුන්ද - නාගොඩ | 2.72 | 388 |
| ඒ004 | කිරුළපන - ගොඩගම | 13.3 | 1,400 |
| බී084 | පාමංකඩ - කැස්බෑව | 12.76 | 3,721 |
| | එකතුව | 57.59 | 9,450 |

6.2.2 ඉහත මාර්ගවලින් , කටුකුරුන්ද - නාගොඩ මාර්ගය වැඩිදියුණු කිරීමේ වැඩ හා පාමංකඩ - කැස්බෑව මාර්ගයේ වැඩ සඳහා සෝදිසි පරීක්ෂණයන් සිදු කරන ලදී. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) බී 207 කටුකුරුන්ද - නාගොඩ මාර්ගයේ මාර්ග වැඩි දියුණු කිරීම් වැඩ 2012 මැයි 25 ආරම්භ කර තිබුණු අතර 2013 අගෝස්තු 17 ට පෙර නිම කිරීමට අපේක්ෂා කර තිබුණි. උපදේශක විසින් ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තාවට අනුව, මාර්ගයේ වැඩිදියුණු කිරීම් පිළිබඳ භෞතික ප්‍රගතිය 2013 දෙසැම්බර් 31 දිනට සියයට 89 ක්ව පැවතුණි. මේ සම්බන්ධයෙන් තවදුරටත් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ප්‍රගති වාර්තා අනුව, මාර්ග වැඩිදියුණුකිරීම් වැඩ පිළිබඳ ආරම්භක අදියරේදී කොන්ත්‍රාත්කරු දුර්වල ලෙස කටයුතු කර තිබුණු අතර, 2013 ජූනි 30 ට පෙර නිමකළ යුතු වූ ගල් මුල් ඉවත් කර බිම සැකසීම, වැඩබිම හෙලිපෙහෙළි කිරීම හා හැරීම් වැඩ වැනි විවිධ ප්‍රාරම්භක වැඩ දිගු ප්‍රමාදයකින් පසුව සම්පූර්ණ කර තිබුණි. ඉහත සඳහන් ප්‍රමාදයන් හේතුවෙන්, රූදවුම් පැති බැම් ඉදිකිරීම හා ඇස්පල්ට් යෙදීමේ ක්‍රමවත් ක්‍රියාවලින් වැනි වෙනත් විවිධ කාර්යයන් පිළිබඳ කාර්ය වැඩසටහන් සංශෝධනය කර තිබුණි. කෙසේ වුවද 2013 මාර්තු 31 ට පෙර නිමකළ යුතුව තිබූ එම සංශෝධිත කාර්ය වැඩසටහන්ද 2013 දෙසැම්බර් 31 වන විටත් සම්පූර්ණ කර නොතිබුණි. උපයෝගී ද්‍රව්‍ය වෙනත් තැන්වලට මාරුකිරීම, නල එළීම, හා ඉඩම් අත්පත්කර ගැනීම පිළිබඳ ප්‍රමාදයන් නිමකිරීමේ දිනය 2015 අප්‍රේල් 06 දක්වා දිර්ඝ කිරීමට හේතු වී තිබුණි.

(ii) පොළවේ මෘදු පිළියම් වැඩ (soft ground treatment works), උපයෝගී ද්‍රව්‍ය වෙනත් තැන්වලට මාරු කිරීම හා ප්‍රමාණපත්‍රවල විෂයයන් අඩුවෙන් ඇස්තමේන්තු කිරීම හේතුවෙන් වූ සංශෝධිත පිරිවැය ඇස්තමේන්තු, කොන්ත්‍රාත්තු පිරිවැයෙහි සැලකිය යුතු වැඩිවීමක් දක්වයි. රු. මිලියන 346 සිට රු. මිලියන 400 දක්වා කොන්ත්‍රාත්තු පිරිවැය වැඩිවීම සඳහා සංශෝධිත පිරිවැය පුරෝකථනය පිළියෙල කර 2014 මාර්තු 06 දින මාර්ග සංවර්ධන අධිකාරියට ඉදිරිපත් කර තිබුණි.

(ආ) කැස්බෑව - පාමංකඩ මාර්ගයේ වැඩිදියුණු කිරීම් වැඩ 2013 මාර්තු 28 දින ආරම්භ කරන ලද අතර, 2015 මාර්තු 28 ට පෙර නිමකිරීමට අපේක්ෂිතය. උපදේශක විසින් ඉදිරිපත්

කරන ලද ප්‍රගති වාර්තාවලට අනුව, 2013 දෙසැම්බර් 31 දිනට මාර්ගය වැඩි දියුණු කිරීමේ භෞතික ප්‍රගතිය සියයට 13.14 ක්ව පැවතුණ නමුත් එදිනට අපේක්ෂිත ඉලක්කය සියයට 14.88 ක් විය.

මේ සම්බන්ධයෙන් තවදුරටත් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2012 අගෝස්තු 07 දිනැති අංක 2/2012 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව සියළු ප්‍රසම්පාදනයන් සඳහා ඇස්තමේන්තු, ප්‍රසම්පාදනයේ මුළු පිරිවැයෙහි නිවැරදි බව තහවුරු කර ගැනීම සඳහා වන සියළුම කරුණු සැලකිල්ලට ගනිමින් සැකසිය යුතුය. කෙසේ වුවද, රු. මිලියන 660.9 ක්වූ මාර්ග කොටස් දෙකක පුනරුත්ථාපන වැඩ හා රු. මිලියන 95 ක්වූ පාමංකඩ පාලමේ පිරිවැය ආරම්භක ඇස්තමේන්තුවෙන් ඉවත් කරගෙන තිබූ අතර රත්තනපිටිය නව පාලමෙහි පිරිවැය ලබාගැනීමෙන් තොරව එම පාලම ඇතුළත් කර තිබුණි. මෙම තත්ත්වය බොහෝ මතභේදයන්ට හා ව්‍යාපෘතියට අවාසි සහගත බලපෑම් සිදුවන බව නිරීක්ෂණය වේ. තවද මෙවැනි විෂය පථයේ විචලනයන් සඳහා අමාත්‍ය මණ්ඩලය පත් කරන ලද ටෙන්ඩර් මණ්ඩලයේ (CATB) අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ii) ප්‍රාරම්භකයන් හා සාමාන්‍ය විෂයයන් මත එකවර ගෙවීම් සඳහා ඉංජිනේරු ඇස්තමේන්තුව රු. මිලියන 145.33 ක් වුවද කොන්ත්‍රාත්කරු විසින් එම වැඩ සඳහා රු. මිලියන 256 ක් වු මුදලක් ඉදිරිපත් කර තිබුණි. කෙසේ වුවද කොන්ත්‍රාත්කරුගේ ඇස්තමේන්තුව අනුමත කිරීමට පෙර රේටයන් පිළිබඳ විශ්ලේෂණයක් කර නොතිබුණි.

(iii) කොන්ත්‍රාත් ගිවිසුම 2012 ඔක්තෝබර් 01 දින අත්සන් කර තිබුණද, අදියර 01 හි පුනරුත්ථාපන වැඩ සඳහා එම වැඩබිම, මාස 06 ක් ප්‍රමාද වී 2013 මාර්තු 25 දින භාර දී තිබුණි. තවද අදියර 02 (කි.මී 1 + 150 සිට 10 + 450 කොටස) සඳහා වැඩබිම, මාස දෙකක ප්‍රමාදයකින් පසුව 2014 මැයි 20 දින කොන්ත්‍රාත්කරුට භාර දී තිබුණි. පුනරුත්ථාපන වැඩ ආරම්භ කිරීමේ ප්‍රමාදයන් හේතුවෙන් ඉංජිනේරුවරයා විසින් පිළියෙල කරන ලද සංශෝධිත ප්‍රමාණ පත්‍ර අනුව ප්‍රාරම්භකයන් හා සාමාන්‍ය විෂයයන් සඳහා පුනරුත්ථාපන වැඩ පිරිවැය රු. මිලියන 30.36 කින් වැඩි වී තිබුණි.

(iv) රු.මිලියන 249.19 ක් වූ වැඩ පූර්ව අත්තිකාරම්වල දෙවැනි වාරිකය 2013 පෙබරවාරි 19 දින මුදාහැර තිබුණද, වැඩ පූර්ව අත්තිකාරම්වල පළමු වාරිකය මුදා හැර මාස 3 ½ ක ප්‍රමාදයකින් පසු 2013 මාර්තු 28 දින කොන්ත්‍රාත්කරු විසින් වැඩ ආරම්භ කර තිබුණි. විශේෂ කොන්ත්‍රාත් රීතිවල 14.2 (ii) ඡේදයට අනුව, වැඩ පූර්ව අත්තිකාරම් ගෙවීම්වල දෙවන වාරිකය මුදා හැරීමට පෙර කොන්ත්‍රාත්කරු වැඩ ආරම්භ කිරීම අවශ්‍ය වේ.

(v) කොන්ත්‍රාත්තුවේ විශේෂ කොන්දේසිවල 14.6 ඡේදය අනුව, අතුරු ගෙවීම්වල අවම වටිනාකම රු. මිලියන 66.4 කට සීමා විය. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය තුළදී සිදු කරන ලද අතුරු ගෙවීම් අවස්ථා 09 න් අවස්ථා 07 කදී අවශ්‍ය අවම සීමාව කරා එළඹ නොතිබුණි.

(vi) කොන්ත්‍රාත්තුවේ කොන්දේසි අනුව අදාළ බිල්පත්‍ර පරීක්ෂා කිරීමෙන් පසුව වැඩ බිම් ද්‍රව්‍ය මත අත්තිකාරම් සියයට 80 ක් ගෙවීම සඳහා හිමිකම ඇත. කෙසේ වුවද ලිඛිත සාක්ෂි පරීක්ෂා කිරීමෙන් තොරව රු. මිලියන 49.90 ක්වූ එවැනි දීමනා ගෙවා තිබුණි.

(vii) ඉක්ටාඩ් එස්සීඒ 5 හි 106 රීතිය අනුව, නිම කළ වැඩ මැනීමෙන් පසු අතුරු ගෙවීම් සිදු කළ යුතුය. කෙසේ වුවද භෞතික මැනීම් මඟින් වැඩ පරීක්ෂාවන් සිදු කිරීමෙන් තොරව 2013 නොවැම්බර් මාසයේදී රු. මිලියන 79.74 ක්වූ අතුරු ගෙවීමක් මුදාහැර තිබුණි. තවද එහි ඇතුළත් වූ වැඩිපුර ගෙවීම් රු. මිලියන 18.64 ක් වූ අතර එය 2013 දෙසැම්බර් මාසයේදී ආපසු අයකර ගෙන තිබුණි.

(viii) කොන්ත්‍රාත්කරු විසින් සමාලෝචිත වර්ෂය අවසානයට ක්ෂේත්‍ර රසායනාගාරය ස්ථාපිත කර නොතිබුණද, රු මිලියන 7.82 ක් පිරිවැය වූ රසායනාගාර උපකරණ මිලදී ගෙන තිබුණි. තවද, ක්ෂේත්‍ර රසායනාගාර හා උපකරණ නඩත්තුව සඳහා රු.මිලියන 2.2 ක අතිරේක මුදලක්ද එයට ඇතුළත් වී තිබුණි. තවද, කොන්ත්‍රාත්කරු විසින් පවත්වා ගෙන යනු ලැබූ රසායනාගාර සඳහා රු. මිලියන 7.82 ක පිරිවැයකට කොන්ත්‍රාත්කරු විසින් මිලදී ගන්නා ලද පරීක්ෂණ උපකරණවල ලාභය හා පොදුකාර්ය පිරිවැය ආදිය සඳහා රු මිලියන 0.85 ක්වූ සියයට 10 ක ආන්තිකයක්ද ඇතුළත් කර තිබුණි. ප්‍රමාණ පත්‍ර අනුව, රසායනාගාර

උපකරණ මිලදී ගැනීමට හා උපදේශක සඳහා වෙනම රසායනාගාර පවත්වා ගෙන යාමට රු. මිලියන 5.27 ක්වූ ප්‍රතිපාදනයක් සලසා තිබුණි. කෙසේ වුවද මාර්ග වැඩ සඳහා යොදාගත් ද්‍රව්‍යවල ගුණාත්මක තත්ත්වය තහවුරු කර ගැනීමට මේවා ස්ථාපිත කර නොතිබුණි.

(ix) කොන්ත්‍රාත්කරු විසින් සමස්ත ව්‍යාපෘති කාල පරිච්ඡේදය සඳහා සියළු අවදානම් වෙනුවෙන් රක්ෂණ ආවරණයක් ලබාගත යුතුය. කෙසේ වුවද, විවිධ වර්ගයන් සඳහා වාර්ෂික පදනම මත වෙනම රක්ෂණ ආවරණයක් කොන්ත්‍රාත්කරු විසින් ලබාගෙන තිබුණි. එබැවින් ලබාගත් ආවරණය හා කොන්ත්‍රාත්කරු විසින් ගෙවන ලද වාරිකය පරීක්ෂා කිරීම වෙනුවට එකවර ගෙවීමේ පදනම මත රක්ෂණය ලෙස රු.මිලියන 10 ක මුදලක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. තවද, සියළුම සේවකයන් සඳහා කම්කරු වන්දි වෙනුවෙන් රක්ෂණ ආවරණයක් ලබාගත යුතුය. කෙසේ වුවද, කම්කරුවන් 300 ක් වූ සාමාන්‍ය ශ්‍රම බලකාය ආවරණය වීම සඳහා රක්ෂණ ආවරණයක් ලබා ගැනීම වෙනුවට අදාළ කාල පරිච්ඡේදය තුළ සේවකයන් 54, 94, 106 ආදී වශයෙන් පවත්නා සේවක මණ්ඩලයට තාවකාලික ආවරණ හෝ කෙටි කාල පරිච්ඡේද සඳහා රක්ෂණ ආවරණ ලබාගෙන තිබුණි.

## 6.3 මතභේදයට තුඩුදෙන කරුණු

--------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පාමංකඩ - කැස්බෑව මාර්ගය වැඩි දියුණු කිරීම යටතේ වැඩ විෂය පථයට ඇතුළත් නොකරන ලද වැතර විකල්ප මාර්ගයේ ප්‍රාරම්භක සැලැස්ම පිළියෙල කිරීම සඳහා ව්‍යාපෘතිය විසින් රු. 100,000 ක මුදලක් වැයකර තිබුණි.

(ආ) හොරණ - කොළඹ මාර්ගයේ පිල්ලෑව පන්සල අසල ඉඩමේ පදිංචිව සිටි අනවසර පදිංචිකරුවන් 27 දෙනෙකු සඳහා වන්දි ලෙස රු. 4,860,000 ක මුදලක් වැයකර තිබුණි.

(ඇ) ව්‍යාපෘති කාර්යයන් සඳහා යොදා නොගත් මෝටර් වාහනයක් සඳහා රු. 191,897 ක්වූ ඉන්ධන පිරිවැය ව්‍යාපෘතිය විසින් දරා තිබුණි.

(ඇ) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත ප්‍රකාරව විදේශ මූලායන ව්‍යාපෘති යටතේ ගෙවීම්, එකතු කළ අගය මත බදු වලින් නිදහස් වුවද, ව්‍යාපෘතිය විසින් මාර්ග වැඩි දියුණු කිරීම් වැඩ හා උපදේශක සේවා මත රු. මිලියන 278 ක මුදලක් ගෙවා තිබුණි.

**6.4 ඉඩම් අත්පත් කර ගැනීම.**

----------------------------

මාර්ග, 5 ක පුනරුත්ථාපන කටයුතුවලදී ඉඩම් අත්පත් කර ගැනීම් හා නැවත පදිංචි කිරීමේ කටයුතු සඳහා රු. මිලියන 2,678 ක්වූ මුළු වෙන්කිරීම්වලින් සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු. මිලියන 2,310 ක වන්දි ගෙවා තිබූ බව නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලැබී තිබුණු තොරතුරු අනුව, කැස්බෑව - පාමංකඩ මාර්ගය වැඩි දියුණු කිරීම සඳහා ඉඩම් කැබලි 2681 ක් අත්පත් කර ගෙන තිබූ අතර 2013 දෙසැම්බර් 31 දක්වා රු. මිලියන 257.1 ක මුදලක් ගෙවා තිබුණි. වන්දි ගෙවීම සඳහා ඉඩම් කැබලි 2270 ක් පමණක් සුදුසුකම් ලබා තිබූ බව නිරීක්ෂණය විය. ඉඩම් කැබලි 284 ක් සඳහා පමණක් ගෙවීම් සිදුකර තිබුණි. කෙසේ වුවද ඉඩම් අත්පත් කර ගැනීම සඳහා වන්දි ගෙවීම ප්‍රමාද වීම මත රු. මිලියන 2.1 ක් පොලී ලෙස ගෙවා තිබුණි.

(ආ) සෝදිසි පරීක්ෂණයට අනුව, කැස්බෑව - පාමංකඩ මාර්ගයේ පිළියන්දල අතුරු මාර්ගය සඳහා අත්පත් කරගත් ඉඩම් කැබලි 103 ක් වන්දි ගෙවීම සඳහා තෝරාගෙන තිබුණි. කෙසේ වුවද, රු. මිලියන 89 ක් වූ වන්දි මුදල් ඉඩම් කැබලි 91 ක් සඳහා පමණක් ගෙවා තිබුණි. ඒ සඳහා ගෙවන ලද පොලී වෙනම හඳුනාගෙන නොතිබුණි.

(ඇ) ඉඩම් අත්පත් කර ගැනීම සඳහා වන්දි ගෙවීම මත වියදම්, ව්‍යවස්ථාපිත ගෙවීම්, ඉඩම් හා නැවත පදිංචි කිරීමේ කමිටු (LARC) ගෙවීම්, අත්තිකාරම් ගෙවීම් හා දිරි දීමනා ගෙවීම් ආදී ලෙස වෙනම හඳුනාගෙන නොතිබුණි. එබැවින් ව්‍යාපෘතියේ ඉඩම් අංශය විසින් විගණනයට ඉදිරිපත් කරන ලද ලියකියවිලි සමඟ වියදම සැසඳිය නොහැකි විය.